# බළන්ගොඩ නගර සභාව
## 2021-12-29 වන දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය - බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය - 2021.12.29**

**වේලාව - පෙ.ව. 10.30**

**බළන්ගොඩ නගර සභාවේ ගරු උප සභාපති එම්.ටී.එම්. රූමි මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු උප සභාපති | එම්.ටී.එම්.රූමි මැතිතුමා |
| 2. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්. එම්. එන්. ජී. වීරසිංහ මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | නිමල් කරුණාරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රිනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 6. ගරු නාගරික මන්ත්‍රී | කේ. ජී. පේමදාස මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ලේකම් | එස්. එච්. ඒ. කරුණාරත්න මිය |

ගරු උප සභාපතිතුමන් විසින් මෙදින විශේෂ මහ සභාව සඳහා සහභාගි වූ ගරු නාගරික මන්ත්‍රීවරුන් ඇතුළු සියළුම දෙනා පිළිගනිමින් ගරු සභාවේ වැඩකටයුතු ආරම්භ කරන ලදි. අද දින පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය, පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය, බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කිරීම හා බළන්ගොඩ නගර සභාව සතු දැන්වීම් පුවරු 10 යන ක්ෂේත්‍රයන් සඳහා කැඳවන ලද ටෙන්ඩර්පත් විවෘත කිරීම හා සුදුසු බදුකරුවන් තෝරා ගැනීම වෙනුවෙන් මෙදින විශේෂ මහ සභාව පවත්වන බව දන්වන ලදී. ඒ සඳහා ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එන්.ජී. වීරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් මහ සභාව කාරක සභාවක් බවට පත්කරන ලදි.

ටෙන්ඩර් පත් විවෘත කිරීමෙන් අනතුරුව ගරු උප සභාපතිතුමාගේ යෝජනාවෙන් හා ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමාගේ ස්ථිරත්වයෙන් කාරක සභාව මහ සභාව බවට පත්කර ගන්නා ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද පහත සඳහන් තීරණ සියල්ල ගරු උප සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- බළන්ගොඩ නගරයේ පෞද්ගලික බස් ගාල් ගාස්තු අය කර පවත්වාගෙන යාම සඳහා ටෙන්ඩර් පත් 01ක් පමණක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත ලැබී තිබුණි. එහිදී මාදම්පේ උදය ශාන්ත යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු. 95,050.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 15 දරණ එළු මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් 02 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් දෙකම ලැබී තිබුණි. එහිදී මන්සූර් මොහොමඩ් නජීම් යන අය වැඩිම ලංසු මුදල වශයෙන් රු. 21,000.00 ක් ඉදිරිපත් කර තිබූ නමුත් අවශ්‍ය ලියවිලි ඉදිරිපත් කර නොතිබූ බැවින් එම අයදුම්පත ප්‍රතික්ෂේප කරන ලදී. ඒ අනුව ෆලීල් මොහොමඩ් රවුෂාන් යන අය විසින් ඉදිරිපත් කර තිබූ රු. 10,050.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

- බළන්ගොඩ නගර සභාව සතු පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය සඳහා ටෙන්ඩර් පත් 03 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් තුනම ලැබී තිබුණි. අවශ්‍ය කොන්දේසි සපුරා නොතිබීම නිසා අයදුම්පත්‍ර තුනම ටෙන්ඩර් මණ්ඩලය විසින් ප්‍රතික්ෂේප කරන ලදී.

- බළන්ගොඩ නගර සභාව සතු දන්වීම් පුවරු 10 සඳහා ටෙන්ඩර් පත් 03 ක් නිකුත් කර තිබූ අතර, එම ලංසුපත් තුනම ලැබී තිබුණි. එහිදී කේ.ඩී. ගුණවර්ධන යන අය විසින් වැඩිම ලංසු මුදල වශයෙන් රු. 36,250.00 ක් ඉදිරිපත් කර තිබූ නමුත් ඔහු ටෙන්ඩරය භාර ගැනීම ප්‍රතික්ෂේප කිරීම මත ඒ. සුමිත් කුමාර යන අය ඉදිරිපත් කර තිබූ රු. 31,250.00 ක මාසික ලංසු මුදල පිළිගැනීමට ටෙන්ඩර් මණ්ඩලය තීරණය කරන ලදි.

ටෙන්ඩර් මණ්ඩලය විසින් අනුමත කරන ලද ඉහතින් ලබාගන්නා තීරණ සියල්ල ගරු උප සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම හා පොදු වෙළඳසැල අංක 16 දරණ ගව මස් කඩ කාමරය තක්සේරු මුදල අවම ලංසු මුදල ලෙස සලකමින් නැවත වරක් ටෙන්ඩර් කිරීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී නිමල් කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

අද දින ගරු සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය හා කාර්ය මණ්ඩලය සඳහා ස්තුතිය පුදකරමින් පෙ.ව 11.00 ට පමණ විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

එම්.ටී.එම්. රුමි,
උප සභාපති,
බළන්ගොඩ නගර සභාව.